බොහෝ විට පුවත් වාර්තාවන්ට සිරස්තල යොදන්නේ එම පුවත් වාර්තාව ලියූ මාධ්‍යවේදියා නොව පුවත්පත් කර්තෘවරයෙකු බව මාධ්‍යවේදීන් විසින් අප වෙත ඉදිරිපත් කර ඇති අදහස් අනුව පැහැදිලි වන කරුණකි. කෙසේ නමුත් ඇතැම් විටක මාධ්‍යවේදියෙකු විසින් ඉදිරිපත් කරනු ලබන පුවත් වාර්තාවක නොමැති මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයන්, මේ ඔස්සේ සිරස්තලය තුළට පැමිණීමද මෙම භාවිතාව ඔස්සේ සිදුවන ගැටළුවකි. මෙය අවස්ථා කිහිපයකදීම මාධ්‍යවේදීන් විසින් අපගේ අවධානයට යොමු කොට තිබිණි.

එසේ නම් මෙය කර්තෘ-මාධ්‍යවේදී දෙපිරිසම අතර පුළුල් සංවාදයකට ප්‍රස්තුත විය යුතු නොවන්නේද? මේ සම්බන්ධයෙන් ඔබ දරණා අදහස කුමක්ද?

#MediaEthicsSL #lka #SinhalaPress #Divaina #Lankadeepa #Mawbima